# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1857/9 - 2014 අප්‍රේල් මස 09 වැනි බදාදා - 2014.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමඟ කියවිය යුතු 2007 අංක 15, 2011 අංක 11 සහ 2012 අංක 11 දරන සංශෝධන පනත් මගින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 මාර්තු මස 31 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ.

**නියෝග**

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වගන්තියට අදාළව සාදන ලද, 2007 ජූලි මස 18 දිනැති අංක 1506/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සහ 2008 අප්‍රේල් 22 දිනැති අංක 1546/9 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත 2007 ජූනි මස 20 දිනැති අංක 1502/10 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගයන් පහත පරිදි තව දුරටත් සංශෝධනය විය යුතු ය.

02.1 ඡේදයේ සඳහන්,

"03 වන හෝ 04 වන නියෝගයන්හි යම් ඡේදයක සඳහන් යම් වෙළඳාමක හෝ යම් ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2007 අප්‍රේල් මස 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා.

i. එම වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම කාර්තුව සඳහා ලබන පිරිවැටුම එම ඡේදයට අනුකූලව නිශ්චය කිරීම.

ii. ඉහත සඳහන් පනතේ 2 වගන්තියේ (2) උප වගන්තියේ (එහි අතුරු විධානයෙහි කරුණු හැර) විධිවිධාන නොසලකා හැරීම ; සහ

iii. එසේ නිශ්චය කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ උපලේඛනයේ විෂයාංක 12හි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට අනුව ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම.

කළ හැකිය."

යන වචන සහ ඉලක්කම් ඉවත් කොට, ඒ වෙනුවට,

1A - PG 2028— 410 (2014/04)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"03 වන හෝ 04 වන නියෝගයන්හි යම් ඡේදයක සඳහන් යම් වෙළඳාමක හෝ යම් ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2007 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා ;

i. එම වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම කාර්තුව සඳහා ලබන පිරිවැටුම එම ඡේදයට අනුකූලව නිශ්චය කිරීම ;

ii. ඉහත සඳහන් පනතේ 2 වගන්තියේ (2) උප වගන්තියේ (එහි අතුරු විධානයෙහි කරුණු හැර) විධිවිධාන නොසලකා හැරීම ; සහ

iii. එසේ නිශ්චය කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන්,

(අ) 2011 මාර්තු 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් අදාළ කාර්තුවක් වෙනුවෙන් ඉහත සඳහන් කරන ලද පනතේ 1 වැනි උපලේඛනයේ 12 වන අයිතමයෙහි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයකට,

(ආ) 2012 මාර්තු 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් අදාළ කාර්තුවක් වෙනුවෙන් ඉහත සඳහන් කරන ලද පනතේ II වැනි උපලේඛනයේ 3(ආ) වන අයිතමයෙහි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයකට, සහ

(ඇ) 2012 අප්‍රේල් 01 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් අදාළ කාර්තුවක් වෙනුවෙන් ඉහත සඳහන් කරන ලද පනතේ III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයකට,

අනුව ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම කළ හැකි ය."

යන වචන හා ඉලක්කම් යෙදීමෙන් එකී වගන්තිය සංශෝධනය විය යුතු ය.

04-694

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.